පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 95

ආයතනයේ නම :- අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අග්‍රාමාත්‍ය අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ නිරීක්‍ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்; 95

நிறுவனத்தின் பெயர்: கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பாக செயற்குழுவினால் சபைக்கு சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ பிரதமர், கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No 95

Name of the institution :- Ministry of Education, Higher Education and Vocational Education
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 95

ආයතනයේ නම - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යාපන අමාත්‍යාංශය)

| අනු අංකය | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 95 වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩු පාඩු | ආයතනය විසින් අඩු පාඩු නිවැරදි කරගැනීම සඳහා ගනු ලැබූ පියවරයන්ට අදාළ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | <u>ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගැටලු</u><br>පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක මෘදුකාංගයක් සකස් කරන ලෙස 2016.02.12 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ලබා දී තිබූ නියෝගය මෙතෙක් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ දත්ත නිවැරදිව යාවත්කාලීන කර නොමැති බවත්, සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ නිශ්චිත තොරතුරු එමගින් ලබා ගත නොහැකි බවත් අනාවරණය විය. | සියලු ගුරුවරුන් පිළිබඳ තොරතුරු ඇතුළත්ව පැවති ජාතික අධ්‍යාපන කළමනාකරණ ගුරු තොරතුරු පද්ධතියෙහි (NEMIS - THRM) දත්ත මේ වන විට තවදුරටත් යාවත්කාලීන වෙමින් පවතී. එසේම මේ වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (EMIS) සකස් කරමින් පවතී. එසේ සකස් කරමින් පවතින අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ගුරු කාර්යය මණ්ඩල මොඩියුලය ගුරුවරුන් සම්බන්ධව යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට පියවර ගත හැකිවනු ඇති අතර එමගින් දැනට පවතින පද්ධතියට වඩා කාර්යක්ෂම ලෙස කාර්ය මණ්ඩල තොරතුරු ලබා ගත හැකිවනු ඇත. |
| 02 | <u>රජයේ පාසල්වල උසස් පෙළ සිසුන් ගේ පැමිණීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතීම</u><br>මේ සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදුකර ඒ සඳහා විසඳුම් සෙවිය යුතු බව හා ඒ සඳහා යෝජනා ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙස 2019.08.08 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නියෝගයක් ලබා දී ඇතත්, මේ වන විටද එම තත්වයේ ප්‍රගතියක් දක්නට නොලැබීම | ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සැලසුම් පීඨයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් 2016 වර්ෂයේ සිදු කරන ලද ශ්‍රී ලංකාවේ පාසල්වල 13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම යන අධ්‍යයනයේ දක්වා ඇති නිර්දේශ අනුව වැඩසටහන් සිදු කර ඇත.<br>අමාත්‍යාංශයේ 2006.12.06 දිනැති 2006/45 චක්‍රලේඛය අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා අධ්‍යාපනය ලබන සෑම පාසල් සිසුවෙකුම විභාගය සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාව වන විට පාසල් පැවැත් වූ දින ගණනින් අවම වශයෙන් 80% ක පැමිණීම තහවුරු කර තිබිය යුතු බව දක්වා ඇත.<br>උසස් පෙළ ගුරුවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය විෂය ඒකක හා අ.පො.ස (උ.පෙළ) විභාගයේදී බහුතර සිසුන් පිරිසකට නිවැරදිව පිළිතුරු ලිවීමට නොහැකි විෂය ඒකක හඳුනාගෙන එම ඒකකයන්හි විෂය කරුණු පිළිබඳව නිවැරදි දැනුම සිසුන්ට ලබා දීම සඳහා උසස් පෙළ විෂය උගන්වන ගුරුවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමට විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගේ සම්පත්දායකත්වයෙන් උසස් පෙළ ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත. එමෙන් ම උසස් පෙළ විෂයන්හි විෂය කරුණු පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබාදීමට ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත.<br>අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ප්‍රායෝගික පරීක්ෂණ, විවිධ විෂයන් සඳහා පමණක් පවත්වන බැවින් විෂය සම්බන්ධ අත්දැකීම් ලබා දීම සහ ප්‍රායෝගික දැනුම ඇත. අවම මට්ටමක පවතියි. එබැවින්, ප්‍රායෝගික විෂය දැනුම ඇගයීමට හැකිවන ලෙස ජාතික ඇගයීම් ක්‍රියාවලිය වෙනස් කිරීම යෝග්‍ය වේ.<br>2026 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව, ජාතික මට්ටමේ සිසු ඇගයීම් ක්‍රමවේදය |

| | | |
|---|---|---|
| | | වෙනස් වනු ඇත. සූතත්‍ය සහ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් ලබා ගත් දැනුම, අඛණ්ඩ ඇගයීම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් තක්සේරු කරනු ලැබේ. ඒ අනුව පෞද්ගලික බාහිර ආයතන මඟින් විෂය කරුණු ආවරණය කර ගැනීමට වඩා ප්‍රායෝගිකව විෂය කරුණු අවබෝධ කර ගැනීමට සිසුන් පාසල් අධ්‍යාපනයට නැඹුරු වනු ඇත. |
| 03 | සිසුන් හා ගුරුවරුන් සඳහා ටැබ් පරිගණක ලබාදීම<br><br>උසස්පෙළ සිසුන් හා ගුරුවරුන් සඳහා ටැබ් පරිගණක ලබාදීම සඳහා 2019 වර්ෂයේදි බිලියන 3.4 ක් වැයකර ටැබ් පරිගණක 96919 ක් හා ආරෝපිත රාක්ක 2639 ක් මිලදි ගෙන තිබුණු අතර, එම පරිගණක වලින් 93027ක් අරමුණින් බැහැරව,6 වසරේ සිට 11 වසර දක්වා සිසුන් වෙත 2020 වර්ෂ අවසානයේ ලබා දී තිබීම.<br>ඉතිරි ටැබ් පරිගණක 3892 ක් රජයේ ආයතන 03ක් වෙත ලබා දි තිබුණු අතර, මෙම පරිගණක ක්‍රියාත්මක කිරිමට විශේෂිත අධ්‍යාපන ක්‍රමයක් හෝ සැලසුම්ගත වැඩසටහනක් (මොඩියුල) සකස්කර නොතිබිම වර්තමානය වන විට බෙදාහරින ලද ටැබ් පරිගණක වැඩි ප්‍රමාණයක් අක්‍රියව හෝ නිෂ්කාර්යව පවතින අතර ඇතැම් ටැබ් පරිගණක අස්ථාන ගත වී තිබිම. | 2024 හා 2025 වර්ෂ වලදී පරිගණක හා උපාංග නඩත්තු කාර්යයන් ගැන වාර්ෂිකව රු.මි.120 බැගින් 126-2-3-22-1302 වැය ශීර්ෂය යටතේ වෙන් කර දී ඇත. ඒ අනුව එම මුදල් පාසල් වල පරිගණක විද්‍යාගාර වල පරිගණක යන්ත්‍ර හා ටැබ්ලට් යන්ත්‍ර වල නඩත්තු කටයුතු සඳහා යොදා ගැනේ. වෙන් කළ මුදලින් රුපියල් මිලියන 25ක ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. ඉතිරි මුදල වන රුපියල් මිලියන 95 ක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වන උපාංග මිලදී ගැනීමට සහ අමාත්‍යාංශය විසින් සෘජුව පවත්වන නඩත්තු වැඩමුළු සඳහා අවශ්‍ය වියදම් දැරීමට යොදා ගැනේ. ඒ අනුව පාසල් හා පළාත් කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා ලැබී ඇති ඉල්ලීම් අනුව ටැබ්ලට් යන්ත්‍ර වල නඩත්තු කටයුතු සිදු කර ඇති අතර නඩත්තු සිදු කිරීමේදී අවශ්‍ය වන උපාංගද මිලදී ගෙන ඇත.<br>පාසල් වල අන්තරජාල බිල්පත් පියවීම සඳහා රු.මි.30 ක ප්‍රතිපාදන 2024 වර්ෂයේ දී ද රුපියල් මිලියන 150ක ප්‍රතිපාදන 2025 වර්ෂයේ දී 126-2-3-2-1402 වැය ශීර්ෂය යටතේ ද වෙන් වී ඇත. මේ යටතේ රු.5,000.00 ක උපරිම මුදලක් පාසල් වෙත ලබා දෙන අතර පාසල විසින් මෙම පාසල්වලට අදාළ මාසික අන්තර්ජාල ගාස්තුවේ ප්‍රමාණය අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුය. ඉන්පසුව ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා පාසල් වෙත ලබා දෙනු ඇත.<br>ටැබ් පරිගණක වල ඵලදායී උපයෝජනය පිළිබඳව නියාමන කාර්යයන් සිදු කිරීම සඳහා සියලුම පළාත් හා කලාපවල අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂකවරුන් දැනුවත් කිරීම. ටැබ්ලට් යන්ත්‍රවල ප්‍රගතිය නියාමනය සඳහා 2023.10.11 දිනැතිව පාසල්වලට දත්ත පත්‍රිකාවක් යොමු කර ඇත. (ඇමුණුම 01) තවද මෙම යන්ත්‍ර සම්බන්ධයෙන් ගැටලු ඇති වන අවස්ථාවලදී ඒ සම්බන්ධව |
| | | කටයුතු කළ ආකාරය පිළිබඳව පාසල් දැනුවත් කිරීම සිදු කර අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දී ඇත. ටැබ්ලට් ලබා දීමේ ව්‍යාපෘතියට අයත් පාසල් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම ගැන ක්‍රමවේදයක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා සකස් කර ගන්නා මෙන් 2024.01.23 දිනැති ලිපියේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. තවද මෙහිදී යොදා ගැනීම සඳහා අධීක්ෂණ පත්‍රිකාවක්ද මෙම ශාඛාව විසින් සකස් කර දී ඇත. (ඇමුණුම 02)පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ විෂය භාර මාණ්ඩලික නිලධාරීන් සඳහා වන ප්‍රගති සමාලෝචන රැස්වීම් අවස්ථාවලදී ද මෙම නියාමන කාර්යයන් පිළිබඳව සාකච්ඡා කරනු ඇත.<br>ඉදිරි ව්‍යාපෘති වලදී ටැබ්ලට් යන්ත්‍ර පමණක් ලබා දීම වෙනුවට සුහුරු පුවරුවක් (SMART BOARD), ටැබ්ලට් යන්ත්‍ර /ලැප්ටොප් යන්ත්‍ර Iota and AI kits ආදිය ලබා දී නව්‍ය තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලැබීමට උපකාරී වන අතර අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක පාසලක් වෙත ලබා දී ඉදිරියේ දී එය ව්‍යාප්ත |

| | | |
|---|---|---|
| | | කිරීමට යෝජිතය. මේ වන විටත් මේ පිළිබඳ ව්‍යාපෘති යෝජනා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. අධ්‍යාපනය පද්ධතිය ඩිජිටල්කරණයට ලක් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සුහුරු පුවරු හා පරිගණක ආශ්‍රිත උපාංග ලබා දීමේ වැඩසටහන් සිදු වේ. විදේශ ආධාර ව්‍යාපෘති යටතේ හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ එවැනි ව්‍යාපාති කිහිපයක් සිදු වේ. |
| 04 | <u>ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරිම.</u><br><br>2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද රු.5,219,297,390ක පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වල එකතුවේ සංයුතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස 2023.04.10 දිනැති 2022 අංක 18 දරන විගණන විමසුම මඟින් දන්වා ඇතත්, ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මෙතෙක් පිළිතුරු ලබා දි නොතිබිම.<br>ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරිමේ ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදී. | <u>ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීමේ ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය</u><br><br>විශේෂඥ කමිටුවක සහභාගීත්වයෙන් සකස් කරන ලද නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සඳහා 2023.10.30 දිනැති ව, කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි වූ අතර, එහි සඳහන් පරිවර්තනීය වෙනස්කම් 31ක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ එකඟතාව පළ වී ඇත.<br>ඒ අනුව ක්ෂේත්‍ර 03ක් යටතේ වන එම පරිවර්තනීය වෙනස්කම් පූර්ව ළමාවිය අධ්‍යාපන, සාමාන්‍ය අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය යන අංශ හතරට සම්බන්ධ වන අයුරින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව මාර්ගගත සිතියම (Road Map) සැකසීම ඇතුළු කාර්යයන් සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විද්වතුන් සහ නිලධාරීන් සමඟ අවස්ථා කිහිපයක දී ම සාකච්ඡා/වැඩමුළු අදියර කිහිපයක් පවත්වා ඇති අතර, ඒ හරහා නිරීක්ෂණ, ක්‍රියාකාරකම්, නිමැවුම් ආදිය ඇතුළත් ලේඛන ද, සවිස්තරාත්මකව සකස් කර ඉදිරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය මූලික පසුබිම නිර්මාණය කර ඇත.<br>වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශන වලට ද අනුගත වන අයුරින්, නූතන විශ්වීය ලෝකයට ද යෝග්‍ය වන අධ්‍යාපනික රටාවක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම සඳහා, මේ වන විට සකස් කර ඇති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් සංවර්ධනය කරමින්, නූතන ශ්‍රී ලංකාවට ගැලපෙන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නගමින් ඇත. |
| 05 | <u>පාසල් වලට අයත් ඉඩම් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විදීම</u> | • **ආරක්ෂක සේවා විද්‍යාලය** - අප සතුව ගොනුවක් තිබුණද එහි අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් වාර්තා වී නොමැත. |
| | රජයේ විගණන කාර්යාලය විසින් සිදු කළ නියැදි පරික්ෂණයකට අනුව ජාතික පාසැල් 09කට සහ අනෙකුත් පාසැල් 22කට අයත් ඉඩම් විශාල ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිම. | • **ශ්‍රී සුමංගල බාලිකා මහා විද්‍යාලය** - 2019.07.22 දින ක්‍රියාත්මක කරන ලද පිස්කල් නියෝග මඟින් අනවසරකරුවන් ඉවත් කිරීමෙන් පසුව ඉඩමේ නිරවුල් භුක්තිය 2019.08.28 දින විදුහල්පති වෙත භාර දී ඇත.<br>• **ශ්‍රී රාහුල මධ්‍ය විද්‍යාලය, කටුගස්තොට**- දැනට අනවසරයෙන් පදිංචිව සිටින එම්.ජේ මෙන්ඩිස් යන අය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයෙන් ලබා දුන් අධිකරණ තීන්දුවට එරෙහිව එම්.ජේ මෙන්ඩිස් විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීම් කර ඇති අතර එම අධිකරණ කාර්ය සඳහා අවසන් තීන්දුවක් ලැබී නොමැත.<br>• **ගම්පොල සහිරා විද්‍යාලය** - ගම්පොළ සහිරා විද්‍යාලය විසින් භුක්ති විඳින ඉඩම් කොටස් නිවැරදිව හඳුනා ගැනීම සඳහා පිඹුර අධිෂ්ඨාපනය කර සකස් කරන ලද අනුරේඛනයක් ලබා ගැනීමට ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී තීරණය වූ අතර ඒ |

| | | |
|---|---|---|
| | | අනුව ලබන වසරේ වාර්ෂික මැනුම් වැඩසටහනට ඇතුළත් කිරීම මගින් හෝ පාසල් සංවර්ධන සමිතියේ ප්‍රතිපාදන වලින් අදාළ මැනුම් ගාස්තු ගෙවීම සිදු කර උක්ත මැනුම් කටයුත්ත සිදු කර ගන්නා ලෙස විදුහල්පති වෙත දන්වා ඇත. එසේම එම කාර්යය අවසන් වූ පසු ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර අනවසරකරුවන් සම්බන්ධ තීරණයක් ගැනීමට නියමිය.<br><br>• **තවලම විද්‍යාරාජ ජාතික පාසල**, ගාල්ල - මෙම ඉඩම තවමත් විධිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා නොමැති අතර දැනට අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයා පරිහරණය කරන භූමි ප්‍රමාණය නියමානුකූල කිරීමට එකඟතාව ලබාදිය නොහැකි බව විදුහල්පති වෙත දන්වා යවා ඇත.<br><br>• **ක්‍රිස්තුදේව පිරිමි විද්‍යාලය**, ගාල්ල - ප්‍රාදේශිය ලේකම් මැදිහත් වී මෙම ගැටළුව නිරාකරණය කර ඇති අතර මේ වන විට අනවසර පදිංචි කරුවන්ගේ ගැටළුවක් නොමැති බව විදුහල්පති විසින් දන්වා ඇත.<br><br>• **ක්‍රිස්තුදේව බාලිකා විදුහල**, ගාල්ල - මෙම විදුහලේ පැවති ඉඩම් ගැටළු සම්බන්ධයෙන් 2023.01.10 දින ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර එහි නිර්දේශ අනුව ප්‍රශ්න ගත ඉඩම් කොටස අවසතු නොකොට රජයට අත්පත්කර ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදුකර ඇත<br><br>• **බණ්ඩාරවෙල විශාඛා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය**- මීට වසර කිහිපයකට පෙර අත්කර ගැනීමට යෝජිත ඉඩමට මායිම්ව අනවසර පදිංචිකරුවන්ගේ ඉදිකිරීම් කිහිපයක් පැවතිය ද වර්තමානයේ දී එම සියලු ගැටළු නිරාකරණය කර ඇති බවත්, මෙම ඉඩම අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දීමේ ඉදිරි කටයුතු සිදු කර ගෙන යනු ලබයි.<br><br>• **කෑගල්ල මධ්‍ය මහා විද්‍යාලය** - අනවසර පදිංචිකරුවන් හඳුනා ගැනිම සඳහා මැනුම් කටයුතු සිදුකලයුතු ඇත. පාසලේ නිල නිවාසයන්හි බලහත්කාරයෙන් පදිංචිව සිටි නිලධාරීන් 2020 වසරේ ඉවත් කර ඇත. |
| | | • **ගම්/ ශාන්ත මරියා විද්‍යාලය,** නාවලපිටිය - මොහාන් රාසයියා නැමැති අනවසරකරුවකු තවදුරටත් පාසල් භූමිය භුක්ති විදිමින් සිටි. ඔහුව ඉවත් නොකරන ලෙස 2022.01.01 එක රටක් එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්යය සාධක බලකායේ ලේකම් විසින් අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත.<br><br>• **කො/පිංවත්ත උපනන්ද විද්‍යාලය** - කො/පිංවත්ත උපනන්ද විද්‍යාලයීය භූමිය හා ගොඩනැගිලි බලහත්කාරයෙන් භුක්ති විදින පුද්ගලයන් ඉවත් කර පිළියන්දල අධ්‍යාපන කලාපයේ දෙහිවල එස්. ද .එස්. ජයසිංහ විද්‍යාලයට සම්බන්ධ කර ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීමට තීරණය කර ඇත. එම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දැනුම් දීම සඳහා නීතිපති වෙත යොමු කර ඇත.<br><br>• **කො/කැත්‍රිඩල් (පිරිමි) විද්‍යාලය** - කො/කැත්‍රිඩල් (පිරිමි) විද්‍යාලය හා ශාන්ත ජේම්ස් දේවස්ථාන අතර මායිම් නිරවුල් |

| | | |
|---|---|---|
| | | කර ගැනීම සඳහා අවශ්‍ය මැනුම් කටයුතු අවශ්‍ය පියවර ගන්නා ලෙස බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් වෙත දන්වා ඇත. අනවසරකරුවන් ගැන වාර්තා වී නොමැත.<br><br>• **බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය** - මෙම පාසලේ ක්‍රීඩා පිටිය සඳහා අත් කර ගන්නා ලද ඉඩමෙහි අනවසරකරුවෙක් පදිංචිව සිටි අතර එම පදිංචිකරු එම ඉඩමෙන් ඉවත් කිරීම සඳහා පර්චස් 20 ක් ලබා දී ඇති අතර 2024.10.16 දින පාසලේ විදුහල්පතිනි විශාඛා රාජපක්ෂ මිය සමඟ සිදු කරන ලද දුරකතන සංවාදයේ දී එම අනවසරකරු පාසල අත්පත්කර ගත් ඉඩමෙන් සම්පූර්ණයෙන් ඉවත් වී ඇති බව දන්වන ලදී.<br><br>• **කහගොල්ල මධ්‍ය මහා විද්‍යාලය** - බ/ කහගොල්ල මධ්‍ය මහා විද්‍යාල භූමියට අයත් ඉඩම් කොටස් 03 කින් යුක්තවේ. කහගොල්ල විද්‍යාල භූමිය - අක්.03 රූඩ්.02 පර්. 01 ,වැලිබිස්ස නොහොත් වැලිබිස්ස පතන භූමිය - අක්.01 රූඩ්. 02 පර්. 11,බිංගේතැන්න / දියකිරිල්ලඋල්පත භූමිය - අක් 03 රූඩ්. 02 පර්. 27,වැලිබස්ස නොහොත් වැලිබිස්ස පතන ඉඩම කොටස පාසලට පරිත්‍යාගය සිදුකර ඇත්තේ අනවසර පදිංචිකරුවන් සිටියදී වන අතර එම කොටස පාසල විසින් පරිහරණය නොකරන අතර එම කොටස පාසලේ පරිහරණයට අවශ්‍යනොවේ, බිංගේතැන්න/දියකිරිල්ල උල්පත භූමිය මෙම ඉඩම පිඹුරු අංක 1510 ඉඩම වේ. මෙම ඉඩම් කොටසේ පාසලේ ක්‍රීඩා පිටිය හා ගුරු නිවාස දෙකක් ඇත. මෙම ඉඩමෙන් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමග එක්ව අධිකරණ කටයුතු කර ගෙන යනු ලැබේ.<br><br>• **ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විදුහල** - මීට පෙර අනවසර කරුවන් තුන්දෙනක් සිට ඇති අතර මේ වන විට එම අනවසර කරුවන් සියලු දෙනාම ඉවත් වී ඇත.<br><br>• **ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය** - බෙන්තොට - මෙම ඉඩම තුල අනවසර පදිංචිකරුවන් නොමැති නමුත් ක්‍රීඩාපිටිය යාබද නිවාස සඳහා පිවිසීමට පාසල් ක්‍රීඩා පිටිය හරහා මාර්ගයක් අනවසරෙන් භාවිතා කිරීම සිදුකරන අතර මෙම මාර්ගය නීත්‍යානුකූලව ලබාදීම සිදුකල නොහැකි බව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය කර එය අප වෙත දන්වා ඇත. |
| | | • **මහින්ද විද්‍යාලය** - ගාල්ල - අනවසරකරුවන් හඳුනා ගැනීම සඳහා 2024.02.20 දින මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් මැනුමක් කර ඇත. අනවසරකරුවන් නිශ්චිතව සඳහන් කර නැති බව එම වාර්තාවේ දක්වා ඇතත් තවත් අනවසරකරුවන් අටදෙනෙකු තවදුරටත් සිටින බව සඳහන් කර ඇති බව ගාල්ල ප්‍රාදේශීය ලේකම් දුරකතන මාර්ගයෙන් දන්වා ඇත.<br><br>• **කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය** - මේ වන විට අනවසරකරුවා නියමානුකූල කර පාසල් ඉඩම නිරවුල් කර ඇත.<br><br>• **දංගෙදර ජයවර්ධන විද්‍යාලය** - ගාල්ල -38(අ) අතුරු විධානය නිකුත් කර ඇත. මෙම ඉඩමේ මුල් පදිංචිකරුවන් දෙදෙනෙකු අනවසරව පදිංචිව සිටින බව තහවුරුව ඇති බව ගාල්ලේ ප්‍රාදේශීය ලේකම් 2020.07.15 ලිපියෙන් දන්වා ඇත. |

එම භුක්ති විඳිනා ඉඩම් කොටස් නැවත ලබා දෙන මෙන් ඉල්ලා ඇති බව තවදුරටත් දන්වා ඇත. ඒ හැර තවත් මුල් පදිංචිකරුවෙකු නිවසක් සෑදීමට ඉඩම් කොටසක් ඉල්ලා ඇත. මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් පියවර ගනිමින් සිටී.

- **කිතුලම්පිටිය ආනන්ද මහා විද්‍යාලය** - ගාල්ල 2019.08.07 දින පාසල සඳහා අත්කර ගත් ඉඩමේ වෙනත් පාර්ශව විසින් භුක්ති විඳින ඉඩම් කොටස් වලින් තොරතුරු සංනිවේදන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පර්. 31 හැර ඉතිරි ඉඩම් කොටස් පාසලට අවශ්‍ය බව දකුණු පළාත් අධ්‍යාපන ලේකම් 2018.08.08 දිනැති ලිපියෙන් දන්වා ඇත.

- **පො/මින්නේරිය ජාතික පාසල** -"හිඟුරක්දමන" නැමැති සම්පූර්ණ ඉඩම් කොටසම විධිමත් පරිදි පවරා දෙන මෙන් 2022.03.23 දිනැතිව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. (අනවසරකරුවෙක් වැට මායිමක් ඉදි කර තිබී ඇති බැවින්) අනවසරකරුවන් විසින් අයිතිවාසිකම් ප්‍රකාශ කරන ලද ඉඩම් කොටසට විධිමත් ලේඛන ඔවුන් සතුව නොමැති බැවින් ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැවරීමට සුදුසු බව දන්වා ඇත.

- **කු/යූ.බී වන්නිනායක මධ්‍ය මහා විදුහල** - පාසල් භූමියේ පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු සිදුකර ඇත. නමුත් තවදුරටත් නවසරකරුවන් ඉවත් වී ඇත.

- **එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක විදුහල, කුණ්ඩසාලේ** - පාසල් ඉඩමේ අනවසරයෙන් වගාකටයුතු සිදු වී ඇති අතර වර්තමානය වන විට පාසලේ වැට මායිම් නිවැරදිව සකසා එම අනවසර වගා කටයතු නවතා ඇත.

- **මහ/ ශ්‍රී ස්වර්ණජෝති ජාතික පාසල** - කිරිඔත්කුඹුර ශ්‍රී ස්වර්ණජෝති ජාතික පාසල භූමියේ පිහිටි තේක්ක, මහෝගනී ගස් යාබද නිවසක පදිංචිකරුවකු විසින් ඔහුගේ ඉඩමට අයත් වන ලෙස පාසලේ වැට මායිම් වෙනස් කර ඇති බවත් පාසලට අයත් ඉඩමේ අනවසර බැම්මක් ඉදිකර ඇත. ඒ සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාවක් යොමුකරන ලෙස පිළිමතලාව ප්‍රාදේශීය ලේකම්ගෙන් තොරතුරු විමසා ඇත.

- **අකුරණ අස්හර් ජාතික පාසල** - පාසල් මායිම අසල පුද්ගලයකු විසින් තම නිවසට පිවිසීම සඳහා අනවසරයෙන් පාසල් ඉඩමෙන් අඩි 10ක පමණ ප්‍රමාණයක් භාවිතා කිරීම සිදුවන අතර මේ සම්බන්ධ වාර්තාවක් මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්ගෙන් විමසා ඇත.

- **මහ/ ගලගෙදර මධ්‍ය මහා විද්‍යාලය** - මෙම විද්‍යාලයට අයත් ඉඩමේ කොටසකට සම්බන්ධ වන සේ එම විද්‍යාලයට මායිම්ව ගලා බසින ඔයේ වැලි ගොඩ දැමීම සඳහා පාසල් ඉඩම හරහා පාරක් සාදා ගැනීම සම්බන්ධයෙන් ගලගෙදර ප්‍රාදේශීය ලේකම් වෙතින් 2017.12.29 දිනැති ලිපිය මඟින් කරුණු විමසා ඇත.

- **අනුරුද්ධ කුමාර ජාතික පාසල** - නාවලපිටිය පාසලෙහි මූ.පි මහ 326 පිඹුරෙහි කැබලි 03 දරණ ඉඩම් කොටස වර්තමානය

| | | |
|---|---|---|
| | | වන විට ශ්‍රී වේළුවනාරාම විහාරස්ථානය විසින් භුක්ති විඳින බව ප්‍රාදේශීය මිනින්දෝරු විසින් වාර්තා කර ඇති බව දන්වා ඇත.<br><br>• **ර/ කාමරංගාපිටිය ශ්‍රී ඥානානන්ද විද්‍යාලය** - ඉඩම් අත්පත් කර ගැනීමේදී වැරදි මැනුමක් හේතුවෙන් පෞද්ගලික පාර්ශවයන්ට අයිති ඉඩම් කොටස් දෙකක්ද පාසල් ඉඩමට අත්පත් කර ගෙන ඇත. අංක 4668 පාසල් වත්තේ මානක සැලැස්මේ C හා D කොටස් අනවසරයෙන් භුක්ති විඳින පුද්ගලයන් ඉවත් කිරීමට රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ බලතල ඇත්තේ ප්‍රාදේශීය ලේකම්ට බැවින් අදාළ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත 2017.02.16 දිනැතිව දන්වා ඇත.<br><br>• **මහ/ මදීනා ජාතික පාසල** - මෙම පාසලේ ඉඩම මැන නිරවුල් කිරීම සඳහා එකී පාසල් ඉඩම සම්බන්ධයෙන් මහනුවර දිසාඅධිකරණයේ විභාග වෙමින් පැවති L67/04 දරන නඩුවේ පැවති තත්ත්වය වාර්තා කරන ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2021.02.22 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.<br><br>• **ගම්/අල්-මුබාරක් මධ්‍ය මහා විද්‍යාලය** - පාසලේ පිඹුරුපත් සකස් කරන ලද ක්‍රීඩා භූමියේ ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවකු ගොඩනැගිල්ලක් (නිවසක්) ඉදිකරමින් පවතී. මේ සම්බන්ධව විදුහලේ විදුහල්පති, බියගම ප්‍රාදේශීය සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වරින් වර බියගම පොලිස් ස්ථානාධිපති දැනුවත් කර එම අනවසරකරු සහ අනවසර ඉදිකිරීම පාසල් භූමියෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලා ඇත. එහෙත් වර්තමාන තත්වය අනුව එම අනවසර ඉදිකිරීම මෙම පාසල් භූමියෙන් ඉවත් වී නොමැත.<br><br>• **බණ්ඩාරනායක මධ්‍ය මහා විදුහල**, වේයන්ගොඩ<br>මේ වන විට අනවසර පදිංචිකරුවන් සම්බන්ධ ගැටළු විසඳී ඇත. |
| 06 | ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයේ සේවය කළ නිලධාරිනියකගේ තනතුර අහෝසි කිරීම හේතුවෙන් වන්දි ගෙවීම.<br><br>අමප/08/1742/316/087හා2006.10.04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත කාර්යාල සහයක තනතුරක් සඳහා පත්කර පසුකාලීනව සම්බන්ධීකරණ නිලධාරි තනතුරක් දක්වා උසස් වීම් ලද නිලධාරිනියක් වෙත 2007 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පාරිශ්‍රමික ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ගෙවීම් කර තිබීම සහ එම නිලධාරිනියගේ තනතුර මසක පූර්ව දැනුම්දීමකින් තොරව අහෝසි කර තිබීම හේතුවෙන් අදාළ නිලධාරිනිය වෙත වන්දි මුදල් ගෙවීමට සිදුවී තිබීම. | යුනෙස්කෝ සම්බන්ධීකරණ නිලධාරී දිලුම් ගුණවර්ධන මිය විසින් සියතනතුර අත්හිටුවීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා ප්‍රංශ අධිකරණයෙහි පණවන ලද නඩුව හේතුකොට ගෙන අධ්‍යාපන අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ වන්දි මුදල ප්‍රංශ තානාපති කාර්යාලය මඟින් දිලුම් ගුණවර්ධන මිය වෙත ගෙවීම් කිරීම සඳහා විදේශකටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කර ඇත. ඒ අනුව 126-01-02-14-1508 යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභා වැය ශීර්ෂය මඟින් වන්දි මුදල ගෙවීම සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇත. (ඇමුණුම 01) |

| | | |
|---|---|---|
| 07 | විනය ගැටලු විසඳා අවසන් කිරිම ප්‍රමාද විම<br><br>විසඳා අවසන් කර නොමැති විනය ගැටලු විශාල සංඛ්‍යාවක් පැවතිම සහ ළමා අපචාර සම්බන්ධ විනය ගැටලු දීර්ගකාලයක් තිස්සේ විසඳා අවසන් නොවි තිබිම. | මෙම අමාත්‍යාංශයට අදාළ ආයතනවල විනය ගැටළු ප්‍රමාදයකින් තොරව විසඳා අවසන් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු බව.I අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය හා විමර්ශන අංශය 2023.09.04 දින දක්වා ම පැවතියේ අතිරේක ලේකම් (පාලන) යටතේය. අතිරේක ලේකම් (පාලන) යටතේ ශාඛා ගණනාවක් පැවතීම හේතුවෙන් පැවති අධික රාජකාරී ප්‍රමාණය නිසා විනය හා විමර්ශන ශාඛාවන්හි හදිසි ලිපිගොනු කටයුතු ප්‍රමාද වීම වලක්වා ගැනීම පිණිස ගන්නා ලද ප්‍රධාන පියවරක් වශයෙන් අතිරේක ලේකම් (විනය හා විමර්ශන) නමින් නව තනතුරක් 2023.09.04 දින සිට ඇතිකර විනය හා විමර්ශන අංශය එම අතිරේක ලේකම් යටතට පත්කරන ලදී.<br><br>ii. පසුගිය කාලයේ දී විවිධ හේතූන් මත විනය අංශයේ විෂයය නිලධාරීන් 05 දෙනෙකු අනුප්‍රාප්තිකයෙකු නොමැතිව ශාඛාවේ සේවයෙන් නිදහස් කිරීමට සිදුවීම හේතුවෙන් සහ සහකාර ලේකම් (විනය) තනතුර සැලකිය යුතු කාලයක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ශාඛාවේ රාජකාරී විශාල වශයෙන් අඩපණ විය. මේ වන විට එම පුරප්පාඩු සම්පූර්ණ කරගනිමින් ප්‍රමාද වූ රාජකාරී කඩිනමින් නිමා කරමින් පවතී.<br><br>iii. විනය හා විමර්ශන අංශයට පැවරෙන අධික රාජකාරී ප්‍රමාණය කළමනාකරණය කරගැනීම සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අමතර කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳව බලධාරීන් වෙත දැනුම් දී ඇත.<br>ඒ අනුව ඉදිරියේ දී විනය හා විමර්ශන ශාඛාවන් සඳහා අත්‍යාවශ්‍ය මාණ්ඩලික නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් ප්‍රමාණවත් පරිදි අනුයුක්ත කරනු ඇත.<br><br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම යටතේ නිකුත් කර ඇති 2019.07.13 දිනැති අංක 2131/60 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව, ඒ ඒ පළාත්හි තිබෙන ජාතික පාසල්වල සේවය කරනු ලබන ශ්‍රී ලංකා ගුරු සේවයේ නියුතු ගුරුවරුන්ගේ විනය පාලන බලතල ඒ ඒ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නමට පැවරීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇති අතර, ඒ අනුව මේ වන විට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 05 දෙනෙකු වෙත ගුරු විනය පාලන බලතල පවරා දී ඇත. අනෙකුත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත විනය පාලන බලතල ලබාගැනීම පිණිස ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශයෙන් සිදුකළ යුතු මූලික විමර්ශන ප්‍රමාණය යම් තරමකින් හෝ අඩුකළ හැකි වනු ඇත.<br><br>v. විනය හා විමර්ශන අංශයේ විෂය ලිපිගොනු වල අඩංගු තොරතුරු සියල්ල පරිගණකගත කර රාජකාරී කටයුතු විධිමත් කිරීම සඳහා පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. ඒ අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණ අංශය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ තාක්ෂණ අංශය ඒකාබද්ධ වී අදාළ දත්ත පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.<br><br>vi. නඩු තීන්දු මත ඉදිරි කටයුතු සිදුකළයුතු ගොනුවල කටයුතු ප්‍රමාදවීම අපගේ පාලනයෙන් බැහැර හේතුවක් නිසා සිදුවන්නකි. මෙවන් නඩු බොහෝමයක් ළමා අපචාර හෝ සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් වන නඩු බැවින්, අවසන් නඩු තීන්දු ලබා දී අදාළ |

| | | |
|---|---|---|
| | | නඩු කටයුතු අවසන් කිරීමට සැලකිය යුතු කාලයක් ගත වේ. එබැවින් නඩුවේ අවසාන තීන්දුව ලැබෙන තෙක් විනය ගොනුවේ ඉදිරි කටයුතු ද ඒ හා සමාන කාලයකින් ප්‍රමාද වේ.<br><br>විනය කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන අවසන් නඩු වාර්තාවේ සහතික කරන ලද පිටපත් (කාර්යය සටහන්) අදාළ අධිකරණය මඟින් ගෙන්වා ගැනීම කඩිනම් කරගැනීම සඳහා අමාත්‍යාංශයේ හෝ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් අධිකරණය වෙත යවා ඇතැම් විට එම ලේඛන ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. වරින් වර අධිකරණ වාර්තා නොකැඳවා, නඩුව අවසන් වන තෙක් නඩුවේ වර්තමාන තත්ත්වය වරින් වර අදාළ පොලිස් ස්ථානාධිපතිගෙන් විමසීම ද, නඩු තීන්දුව ලබාදුන් බව වාර්තා වූ විට අධිකරණයෙන් එකී නඩු තීන්දුවේ සහතික කරන ලද පිටපතක් ලබාගැනීමට කටයුතු කිරීම ද සිදුකෙරේ.<br><br>vii. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විමර්ශන කටයුතු සිදුකරන සියලුම නිලධාරීන්ගේ විනය බලධාරියා අධ්‍යාපන ලේකම් නොවන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විනය බලධාරියා වන අවස්ථාවන්හි දී මූලික විමර්ශන වාර්තා සහ අදාළ අනෙකුත් ලේඛන අදාළ විනය බලධරයා වෙත යොමුකර විනය බලධාරියාගේ නියෝග අනුව කටයුතු කිරීමට සිදුවේ.<br>එසේම විනය නියෝග නිකුත් කරනු ලබන්නේ එම අදාළ විනය බලධාරියා විසින් බැවින් එවන් විනය ගොනුවල කටයුතු සම්බන්ධයෙන් ලේකම්ට බලපෑමක් කළ නොහැක. |
| 08 | <u>ජාතික පාසල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 01 ශ්‍රේණියේ නිලධාරින් විදුහල්පති වරු වශයෙන් පත්කර නොතිබිම</u><br><br>ජාතික පාසැල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් විදුහල්පතිවරු වශයෙන් පත්කර නොමැතිවිම. | ජාතික පාසල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරුන් වශයෙන් පත් කර නොතිබීම.<br>අංක 1928/28 හා 2015.08.21 දිනැති ගැසට් පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ '5' පරිශිෂ්ඨය ප්‍රකාරව ජාතික පාසල්වල විදුහල්පති තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් 03 කින් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් කරනු ලබන නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. (රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියකට අනුව මෙම නිර්දේශ කිරීම සිදු කරනු ලැබේ.) ඒ අනුව, 2025.10.31 දිනට පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුරු දැරිය යුතු ජාතික පාසල් 47 ක විදුහල්පති තනතුරු සම්පූර්ණ කිරීමට අදාළව ඉදිරියේ දී අයදුම්පත් කැඳවා සේවා ව්‍යවස්ථානුකූලව නිලධාරීන් පත් කිරීමට නියමිතය.<br>තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක:- 32/2022 හා 2022.09.07 දිනැතිව නිකුත් කර ඇති ස්ථාන මාරු පටිපාටියේ 2.3 යටතේ සඳහන්ව ඇති පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත පත් කරනු ලබන විදුහල්පති තනතුරට අදාළව සිදු කරනු ලබන ස්ථාන මාරුවීම් එම තනතුර සඳහා ස්ථිරව පත් කරන ලද නිලධාරීන් අතර පමණක් සිදු කරනු ලබන බවත්, උක්ත තනතුරුවලට ස්ථිරව පත්කරන ලද නිලධාරීන් විශ්‍රාම ගැනීම හෝ වෙනත් හේතු මත එම තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරු කිරීම් සිදු නොකරන අතර, සේවා ව්‍යවස්ථානුකූලව එම පුරප්පාඩු සම්පූර්ණ කරන බවත්, සඳහන් කරමි. |

| | | |
|---|---|---|
| 09 | <u>විශේෂ අධ්‍යාපන සේවයේ ගුරුපත්වීම්</u><br><br>විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුපත්වීම් ලබා තිබුණු ගුරුවරුන් 207දෙනෙකු එම ක්ෂේත්‍රයේ ඉගැන්වීම් කටයුතු වල නොයොදවා සාමාන්‍ය ඉගැන්වීම් කටයුතු වල යොදවා ඇති බව ජාතික විගණන කාර්යාලය විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂණයකදී හඳුනා ගත් බව කාරක සභාවේදී අනාවරණය විය. | විශේෂ අධ්‍යාපන විෂය සඳහා ගුරු පත්වීම් ලැබ දැනට වෙනත් විෂයන් ඉගැන්වීමේ නිරත ගුරුවරුන් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඉගැන්වීමේ නිරත විය යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 42/2012 චක්‍ර ලේඛය සහ ED/9/18/8/2/6 දරන අධ්‍යාපන ලේකම්ගේ නියෝග ලිපිය නිකුත් කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ37/2020 පරිච්ඡේද අංක 12.0 සිට 12.4 දක්වා එය තහවුරු කර ඇත.ඒ අනුව, එලෙස සේවයේ නොයෙදෙන ගුරුවරුන්ට දැනුම් දී ඉන්පසු වැටුප් වර්ධක අත්හිටුවීම කළ යුතුය.<br>විශේෂ අධ්‍යාපන සේවයේ නොයෙදෙන ගුරුවරුන් සම්බන්ධව සොයා බලා අදාළ විෂය ඉගැන්වීමෙහි නිරත කරවීමට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, විදුහල්පතිවරුන් අදාළ අධ්‍යාපන නිලධාරීන් දැනුවත් කර ඇත.<br>ජාතික පාසල්වල ගුරුවරුන් පිළිබඳව මෙම අමාත්‍යාංශය මඟින්ද පළාත් පාසල්වල ගුරුවරුන් පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාල හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින්ද සේවයේ යෙදවීමේ කාර්යය කළ යුතු වේ. |
| 10 | <u>ක්‍රීඩා පාසල් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම</u><br><br>ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණින් 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසල් වල කටයුතු පූර්ණ ක්‍රියාකාරී තත්වයේ නොපවතින බව හා 2022,2023 වර්ෂ සඳහා ක්‍රීඩා සිසුන් ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව කාරක සභාවේ දී අනාවරනය විය. | ක්‍රියාත්මක ක්‍රීඩා පාසල් සඳහා 2024,2025 වර්ෂ වල ඒ ඒ පාසල මඟින් චක්‍රලේඛ ප්‍රකාරව පරීක්ෂණයට බඳුන් කර ඉදිරිපත් කරන ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් බඳවාගෙන ඇත.<br>පළාත් 05 ක ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම සම්බන්ධ අයවැය යෝජනා අනුව ඒ ඒ ක්‍රීඩා පාසලේ හඳුනාගත් භෞතික පහසුකම් සංවර්ධනය සඳහා මිලියන 200 ක මුදලක් දිස්ත්‍රික් ලේකම්වරු හරහා පහත පාසල් සඳහා ලබා දී ඇත.<br>• යාපනය මධ්‍ය විද්‍යාලය<br>• හංවැල්ල රාජසිංහ විද්‍යාලය<br>• අනුරාධපුර මධ්‍ය විද්‍යාලය<br>• අකුරම්බඩ වීර කැප්පෙටිපොල මහාවිද්‍යාලය<br>• වලල මධ්‍ය විද්‍යාලය<br>• ආණමඩුව මධ්‍ය විද්‍යාලය<br><br>ක්‍රීඩා ශිෂ්‍යත්ව දීමනාව 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට මසකට එක් ශිෂ්‍යයකුට රු 10,000 බැගින් ලබා දීමටත් එම දීමනා කඩිනමින් පාසල වෙත ලැබීම අරමුණු කරගෙන ක්‍රීඩා පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයට දෙවන කාර්තුවේදී යැවීමට කටයුතු කර ඇත. |
| 11 | <u>ශිෂ්‍ය භට හා බාලදක්ෂ ව්‍යාපාරය ව්‍යා ප්ත කිරීම</u> | ආරක්ෂක අමාත්‍යාංශයේ හා බාලදක්ෂ සංගමය සමඟ සාකච්ඡා කර ශිෂ්‍යභට හා බාල දක්ෂ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කළ යුතු බවද කාරක සභාව ප්‍රකාශ කළේය,<br><br>1. ශිෂ්‍යභට ව්‍යාපාරයට දරුවන් නැඹුරු කිරීම සම්බන්ධයෙන් විදුහල්පතිවරු දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර ඉදිරියේදිද සිදු කිරීමට සැලසුම්කර ඇත.<br><br>2. බාල දක්ෂ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම සඳහා බාලදක්ෂ සංගමයේ මුලිකත්වයෙන් ජාතික මට්ටමින් වැඩසටහන් සිදු කරමින් ඇත. |
| 12 | <u>ක්‍රීඩා සභාවේ කටයුතු අකර්මන්‍ය වී තිබීම</u><br><br>පාසැල් මට්ටමින් ක්‍රීඩා සංවර්ධනය කිරීම නියාමනය කිරීම සහ පාසල් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම අරමුණු කර | • පාසල් ක්‍රීඩා සභාව හා පාසල් ක්‍රීඩා සංගම් යාවත් කාලීන කිරීම සඳහා 05/2020 චක්‍ර ලේඛය නැවත සංශෝධනය කර 03/2021 චක්‍ර ලේඛය ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ දී සියලුම පාසල් ක්‍රීඩා නිලවරණ පවත්වා නව නිළධාරී පත් කිරීම, පත්කරගත් නව නිළධාරී |

| | | |
|---|---|---|
| | ගෙන පිහිටුවා තිබුණු ක්‍රිඩා සභාවේ ක්‍රියාකාරිත්වය වර්තමානය වන විට අක්‍රිය වි තිබිම හේතුවෙන් පාසල් ක්‍රීඩා සංගම්වල මුල්‍ය කටයුතු පාලනය හා අධික්ෂණය නිසි පරිදි සිදුනොවිම. | මණ්ඩලයේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළු පැවැත්විම.<br>• ඒ ඒ පාසල් ක්‍රීඩා සංගම් වාර්ෂිකව මහ සභා රැස්විම් පවත්වා වාර්ෂිකව මූල්‍ය විගණනය සිදුකිරිම.<br>• උපදෙස් පරිදි පාසැල් ක්‍රිඩා සංගම් වාර්ෂිකව දේශිය විදේශීය තරඟ සංවිධානය කිරිම හා සහභාගීවිම සිදු කිරිම. |
| 13 | <u>පාසල් සිසුන් ජාත්‍යන්තර තරඟවලට සහභාගි විම නියාමනය කිරිම සඳහා අමාත්‍යාංශය සතුව පවතින වැඩ පිළිවෙල</u> | ජාතික සංගම් පාසල් ක්‍රීඩා සංගම් හා ක්‍රීඩා අමාත්‍යාංශය මෙන්ම පාසල් වෙත ඍජුව ලැබෙන ආරාධනාවන් සලකා ජාත්‍යන්තර හා විදෙස් රටවල පවත්වන ක්‍රීඩා තරග සඳහා අනුමැතිය ලබා දිමේ කටයුතු සිදුවේ. එහිදි පිළිගත් ජාත්‍යන්තර තරග මෙන්ම ඉහත ඉල්ලිම් කෙරෙන ආයතන මගින් සංචාර සඳහා දරුවන්ට විදෙස් අත්දැකිමක් ලබා ගැනිම සඳහා අනුමැතිය ලබා දිමේ කාර්ය සිදු කරයි. |
| 14 | <u>කොරියානු EXIM බැංකු ණය යටතේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 03ක් ස්ථාපනය කිරිම</u><br>මෙම ව්‍යාපෘතිය පිළිබද වර්තමාන තත්ත්වය ප්‍රගතිය කාරක සභාව විසින් විමසන ලදී. | අමප/18/1142/835/005 අංක දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් හා අංක අමප/19/3468/219/016 මඟින් අනුමැතිය මඟින් ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 484, උතුර පිටිපන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාහේනවත්ත ඉඩම යොදාගැනීමට අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම පිළිවෙලින් අමප/21/1324/308/113 හා අමප/21/1655/308/113-1 මඟින් දකුණු පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දකුණු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක පාසලක් වන ගාල්ල පණාගමුව අමරසිංහ පාසල් භූමියේ ඉදිකිරීමටත්, නැගෙනහිර පළාත් මධ්‍යස්ථානය නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇතුලු වරාය පාරේ මූලික පිඹුරු අංක 528 හි කැබලි අංක 1 ඉඩම යොදාගැනීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.<br>2019 නොවැම්බර් 05 වන දින අත්සන් තබන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාවෙහි සංශෝධිත ශක්‍යතා අධ්‍යයන වාර්තාව ණය ගිවිසුම සංශෝධනය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2022-12-15 වන දින ලබාදී ඇත. එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් කොරියානු EXIM බැංකුව වෙත 2023 ජනවාරි මස යොමුකර ඇත. |
| | | National ICT Hub ව්‍යාපෘතියට අදාළව ණය ගිවිසුම සංශෝධනය සිදුකිරීම කොරියානු EXIM බැංකුව විසින් සිදු කරන ලද කාර්යයක් බැවින්ද, ශ්‍රී ලංකා රජයේ ණය ප්‍රතිපත්ති ක්‍රියාවලියද හේතුවෙන් මෙම ණය ගිවිසුමේ සංශෝධනය ප්‍රමාද වීම කොරියානු EXIM බැංකුව පාර්ශවයෙන් සිදු වූ බැවින් වරින් වර මේ සම්බන්ධයෙන් සිහි කැඳවීම යොමු කිරීම පමණක් සිදු කර ඇත.අදාළ සංශෝධිත ණය ගිවිසුම 2024.09.18 දින අත්සන් කරන ලදී. ඉන් අනතුරුව උපදේශන ප්‍රසම්පාදන කාර්යය ආරම්භ කරන ලදී. නමුත් 2024 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසුව රජයේ නව ප්‍රතිපත්ති සමඟ අනුගත වනසේ ව්‍යාපෘතිය සංශෝධනය කිරීම සඳහා මහා පරිමාණ ව්‍යපෘති සමාලෝචනය කිරීම යටතේ මෙම ව්‍යාපෘතියද සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව 2025 ජනවාරි 03 වන දින පැවති සාකච්ඡාවකදී ශ්‍රී ලංකා රජයේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරයා සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ලේකම්වරයා විසින් දැනුම් දුන් පරිදි මෙම ව්‍යාපෘතිය |

| | | |
|---|---|---|
| | | සමාලෝචනය කිරීමට තීරණය කර ඇත. සමාලෝචන කාලසීමාව තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කටයුතු සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීමට අදාළව ආරම්භ කරන ලද කටයුතු තාවකාලිකව නවතා දමා ඇත.<br>අදාළ ව්‍යාපෘති සමාලෝචන කමිටුව විසින් කමිටු වාර්තාව ලබාදීමෙන් අනතුරුව ව්‍යාපෘතිය එලෙසම පවත්වාගෙන යාමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ලේකම්වරයාට අනුමැතිය ලබා දී ඇති අතර ඒ මත පදනම්ව ණය ගිවිසුමට අනුව උපදේශක සමාගමක් බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය නැවත ආරම්භ කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් කර ඇත. ඒ අනුව 2025 ජූලි මස සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත ආරම්භ කර ඇත. මුල් අදියර ලෙස පළමු මාස 6 තුලදී උපදේශන සේවා ප්‍රසම්පාදනය අවසන් කර ඇත. |
| 15 | <u>පත්තල ගෙදර විද්‍යා උපකරණ ගබඩාවේ සිදු වී තිබූ අක්‍රමිකතාවය</u><br><br>පත්තල ගෙදර විද්‍යා උපකරණ ගබඩාවේ රුපියල් මිලියන 12.9ක අක්‍රමිකතාවක් සිදු වීම සම්බන්ධ විමර්ශනයේ වර්තමාන තත්ත්වය | i. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයේ විමර්ශන වාර්තාව ලබා දී ඇති අතර, එහි සඳහන් විමර්ශන නිර්දේශ අතුරින් විනය අංශය මඟින් ක්‍රියාත්මක කළයුතු නිර්දේශ සියල්ල ක්‍රියාත්මක කර අවසන්ය.<br><br>ii. මු.රෙ.104 හානි පාඩු පරීක්ෂණ කටයුතු සඳහා 2025.10.09 දින එක පුද්ගල පරීක්ෂණ කමිටුවක් පත්කර ඇත. |
| 16 | <u>නිලධාරින්ගේ හිඟ ණය ශේෂ විශාල ප්‍රමාණයක් පැවතීම</u><br><br>සැසඳුම් ප්‍රකාශ අනුව ස්ථාන මාරු වී පැමිණි ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාම ගිය වැඩ තහනම් කළ, සේවය හැර ගිය සේවයෙන් මුදාහල නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු ශේෂය රු. 198,883,895ක් විය ඉන් වර්ෂ 05ක් ඉක්මවූ ශේෂය රු.75,155,836ක් වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇමුණුම 02 |
| 17 | <u>ජාතික පාසැල් ප්‍රමාණය 1000 දක්වා සංවර්ධනය කිරීමේ වැඩසටහන සම්බන්ධ ගැටළු</u><br><br>මෙම වැඩසටහන සඳහා රු. මිලියන 2285ක් පමණ වැය කර තිබුණද, මෙතෙක් ජාතික පාසැල් බවට පත්කර ඇත්තේ පාසැල් 22 ක් පමණක් වීම. | කමිටුවක් පත්කර විමර්ශණයක් සිදුකරමින් පවති<br>ඇමුණුම 03 |
| 18 | අධ්‍යාපන අමාත්‍යාංශයට විදේශ අධාර ලෙස ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතීම | i.ඉන්දියානු රජයේ ආධාර යටතේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැඟිලි ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේදී අවසන් කර තිබුණි. මෙම පාසල සඳහා පරිගණක උපාංග හා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් රු.6,658,405/-ක ප්‍රතිපාදනයන්ට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් වී නොතිබීම. |

| | | |
|---|---|---|
| | | ඒ අනුව 2019 ඉදි කිරීම් කටයුතු අවසන් වී වසර 04ක් ඉක්මවා තිබියදීත් මෙම ව්‍යාපෘතියට අදාළ උපකරණ මිලදී ගැනීම අවසන් කිරීමට කළමනාකරණය අපොහොසත්වී තිබුණි. කෘෂිකාර්මික උපකරණ(Agriculture equipment), ඉලෙක්ට්‍රොනික උපකරණ (Electronics), මුළුතැන්ගෙයි උපකරණ (Kitchen utensil), ගෘහ භාණ්ඩ (Furniture) හා තොරතුරු තාක්ෂණික උපකරණ (IT equipment) ලබා දීමේ කටයුතු අවසන් කර ඇත. විද්‍යාගාර උපකරණ (Science Lab equipment) ලබාදීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අදාළ ලියකියවිලිවලට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇත.<br>ii. KOIKA ව්‍යාපෘතිය ඇමුණුම 04 මගින් දක්වා ඇත. |
| 19 | ගුරු සේවය, ගුරු උපදේශක සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, අධ්‍යාපන පරිපාලන සේවය, යන සේවා 4ට අදාළව සහ පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධව පවතින ගැටළු<br>1. එක් එක් සේවාවන් හා ශ්‍රේණි අතර පවතින වැටුප් විෂමතා පැවතිම.<br>2. කාර්යමණ්ඩල පුරප්පාඩු පැවතිම<br>3. ගුරු උසස්වීම් ලබාදිම ප්‍රමාද විම | **පිරිවෙන් අධ්‍යාපනය**<br>පරිවේනාචාර්යවරුන් සඳහා විධායක සේවා ගණයේ තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කර විධායක සේවා ගණයේ තනතුරු 33 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CM/08/Piriven හා 2024.02.21 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.<br>එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත මගේ අංක ED/ST/BUD/03/01/46 හා 2024.08.06 දිනැති ලිපියෙන් යොමුකර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබා දී ඇත. ඒ අනුව අදාළ නිර්දේශයන් ඇතුළත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වෙත යැවීමට බඳවා ගැනීමේ පටිපාටිය සකස් කරමින් පවතී.<br>කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/SM 14/ Vol.II හා 2023.03.30 දිනැති ලිපියෙන් පරිවේනාචාර්ය තනතුරු 7591ක් මේ වන විට අනුමත කර ඇත. ඒ අනුව අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කරමින් පවතී. ගුරු උපදේශක තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ වෙතින් ඉල්ලීම් කර ඇතත් මෙතෙක් අනුමැතිය ලබා දී නොමැත.පවතින ආර්ථික අර්බුදය නිසා ගොනුව පසෙක තබන ලෙස හිටපු අධ්‍යාපන ඇමතිතුමාගෙන් උපදෙස් ලැබී ඇත.<br>පිරිවෙන් අභ්‍යාස අයතනවල කථිකාචාර්යවරුන්ගේ තනතුරු |
| | | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කළ ද පිරිවෙන් අංශයට අදාළ තනතුරු එකින් එක අනුමත කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් සාකච්ඡාවලදී දැනුම් දෙන ලදී. ඒ අනුව මෙතෙක් කථිකාචාර්ය තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර නැත. තනතුරු අනුමත කළ පසු බඳවා ගැනීම් පටිපාටිය සකස් කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව තනතුරු දරන්නාට පුද්ගලික වන සේ ස්ථාපිත කර ඇති සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා විධායක සේවා ගණයේ උසස් කිරීම් පටිපාටිය සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. එම සහකාර අධ්‍යක්ෂකවරුන් අදාළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පත්වීම ලිපි කෙටුම්පත් කර රාජ්‍යසේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.<br>පිරිවෙන් ගුරු වැටුපෙන් අමතර 6%ක ප්‍රමාණයක් දායක විශ්‍රාම වැටුප සඳහා අයකර ගැනීම වෙනුවට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්ති තීරණයක් ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කරන ලදී. ඒ අනුව |

ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට පිරිවෙන් ගුරුවරුන් ද ඇතුළත් කර ගැනීමට අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කරන බව 2024.09.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දැනුම් දී ඇත.

පිරිවෙන් සංවර්ධන අරමුදල් රැස්කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව පරිත්‍යාගශීලින්ගෙන් ලැබෙන ආධාර හා ප්‍රතිපාදන ගිණුමෙහි රැස් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතියෙන් ගිණුම ආරම්භ කර ඇත. ඉදිරියේදී එම ගිණුමෙන් මුදල් වියදම් කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකස් කිරීම සඳහා පිරිවෙන් සංවර්ධන අරමුදල, පිරිවෙන් පනතට ඇතුලත් කිරීමට අවශ්‍ය සංශෝධන සිදු කරමින් පවතී. පිරිවෙන් සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩල ලබා දීම සඳහා බහු කාර්ය දෙපාර්තමේන්තුව යටතේ පුහුණුවලත් පුහුණුලාභීන් සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වා කාර්ය සහයකයින් 395ක් බඳවා ගෙන අත්‍යවශ්‍ය පිරිවෙන් හඳුනාගෙන ඒ වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

**ගුරු උපදේශක සේවය**

ගුරුඋපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා එකඟතාවය පලකළ අය මේ වන විට අන්තර්ග්‍රහණය කිරීම කර අවසන් කර ඇති බව අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව අනුව ගුරු උපදේශක සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 4471ක් වන අතර, ඒ සඳහා අන්තර්ග්‍රහණයවීමට කැමති ගුරුසේවයේ නිලධරයන් අන්තර්ග්‍රහණය සඳහා 2021.12.31 දින දක්වා වසරක කාලයක් මනාපය පල කිරීම සඳහා අවස්ථාව ලබා දී ඒ අනුව මනාපය පළ කරන ලද නිලධරයන් ගුරු උපදේශක සේවයට 2022.01.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ග්‍රහණය සිදු කර එම අන්තර්ග්‍රහණ කටයුතු අවසන් කර ඇත. එමෙන්ම ගුරු උපදේශක සේවයේ තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත නව බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කරන ලද අතර, එහිදී බඳවා ගැනීමට අදාළ විභාගය සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව එකී සංශෝධන සඳහා අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් 2025.07.29 දිනැතිව ලැබී ඇති අතර එම සංශෝධනයන් රජයේ ගැසට්පත්‍රයේ පළ කිරීම මඟින් ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව සංශෝධනය කර ඒ අනුව නව බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමින් පවතී.විවිධ සේවාවන් අතර වැටුප් විෂමතා පැවතීම මෙහිදී මුහුණපාන ප්‍රධාන ගැටලුව බව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව ගුරු උපදේශක සේවයේ අවසන් වැටුප් වර්ධකයේ අගය ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ එම අගයන්ට සාපේක්ෂව සැලකිය යුතු අගයකින් අඩු අගයක තබා ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර එම විෂමතාවය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

**ගුරු සේවය**

ගුරු සේවයේ හඳුනාගත් පුරප්පාඩු 32000 ක් පමණ පවතින බව 2025.05.31දිනට සියලුම ජාතික හා පළාත් පාසල්හි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එම 32000 ප්‍රමාණයට වඩා වැඩි වී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| පළාත් පාසල්/ ජාතික පාසල් | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පාසල් | | 4484 |
| පළාත් පාසල් | බස්නාහිර | 4630 |
| | දකුණ | 2513 |
| | මධ්‍යම | 6318 |
| | වයඹ | 2990 |
| | ඌව | 2780 |
| | උතුරු මැද | 1568 |
| | නැගෙනහිර | 6613 |
| | සබරගමුව | 3994 |
| | උතුර | 3271 |
| එකතුව | | 36178 |

දිවයිනේ හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ ජාතික හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් පත්‍රයක් නිකුත් කරන ලද නමුත් එම ගැසට් පත්රයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ නඩු හේතුවෙන් අතුරු නියෝගයක් මත 2023.03.25 දින පැවැත්වීමට නියමිත වූ විභාගය පැවැත්වීම තාවකාලිකව නතර කර ඇති බැවින් මේ දක්වා එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකිරීමට නොහැකි වී ඇති අතර අනෙකුත් උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමටද ඉන් බාධාවක් වී ඇත. ඒ අනුව, එම ගැසට් නිවේදනය මගින් බඳවා ගැනීමට අපේක්ෂිත වූ ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් අවුරා තැබීමට සිදුවන අතර ඊට අමතරව තවදුරටත් පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති රාජ්‍ය සේවයේ බඳවා ගැනීම සමාලෝචන කමිටුවට ඉල්ලීම ඉදිරිපත් කර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.තවද, දිවයිනේ වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්හි පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරු සහායකයින් බඳවා ගැනීමට අදාළව අංක 2389 හා 2024.06.14 දිනැති ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර ඊට අනුව 2024.08.12 දින පැවැත්වීමට නියමිතව තිබූ බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා අභියාචනාධිකරණ නඩු අංක CA (Writ) 519/2024 යටතේ නඩු පැවරීම හේතුවෙන් ගරු අධිකරණය විසින් 2024.08.09 දින අදාළ තරඟ විභාගය පැවැත්වීමට අතුරු තහනම් නියෝගයක් පනවා ඇත. එබැවින් එම නඩුව අවසන් වූ පසු එම බඳවා ගැනීම සම්බන්ධයෙන්ද ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

<u>අධ්‍යාපන පරිපාලන සේවය</u>

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන්ගේ ස්ථානගත කිරීම් හා ස්ථාන මාරු වීම් සම්බන්ධයෙන් 2022.12.14 දිනැතිව අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 244 සිට 287 දක්වා වන රීතිවල සඳහන් විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි සහ 2021.10.04 දිනැති අංක 2248/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා

| | | |
|---|---|---|
| | | කොමිෂන් සභාවේ බලතල පැවරීමට අදාළ විධිවිධාන පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් සඳහා ස්ථාන මාරු වීම් ලබා දීම සිදු කරනු ලැබේ.<br>එසේම, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය (I,II,III ශ්‍රේණි) සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති අතර, ඒ අනුව 2022 වර්ෂයේ සිට එම පටිපාටිය ක්‍රියාත්මක වේ.(අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 32/2022 හා 2022.09.07 දිනැතිව නිකුත් කර ඇති ස්ථාන මාරු පටිපාටිය).<br>දිවයින පුරා ඇති ජාතික පාසල් 396 හි, විදුහල්පති පත්කිරීම් අධ්‍යාපන සේවා ආයතන ශාඛාව විසින් සිදුකරන අතර එහිදී ශ්‍රී ලංකා අ.ප.සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්, ශ්‍රී ලං.අ.ප.සේවයේ II/III ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල් සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල් ලෙස වර්ගීකරණය කර ඇත. වාර්ෂිකව මෙම කාණ්ඩ යටතේ පුරප්පාඩු පවතින ජාතික පාසල් සඳහා සුදුසු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය අනුව සුදුසු නිලධාරීන් විදුහල්පති තනතුර සඳහා පත්කරනු ලබයි. එමෙන්ම එසේ පත්වන නිලධාරීන් අවම වශයෙන් වසර 03 ක කාලයක් තමාට හිමිවන පාසලේ විදුහල්පති තනතුර දැරිය යුතු බව එම පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇත. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 32/2022 හා 2022.09.07 දිනැතිව නිකුත් කර ඇති ස්ථාන මාරු පටිපාටියේ 2.3 යටතේ සඳහන්ව ඇති පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත පත් කරනු ලබන විදුහල්පති තනතුරට අදාළව සිදු කරනු ලබන ස්ථාන මාරුවීම් එම තනතුර සඳහා ස්ථිරව පත් කරන ලද නිලධාරීන් අතර පමණක් සිදු කරනු ලබන බවත්, උක්ත තනතුරුවලට ස්ථිරව පත්කරන ලද නිලධාරීන් විශ්‍රාම ගැනීම හෝ වෙනත් හේතු මත එම තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරු කිරීම් සිදු නොකරන අතර, සේවා ව්‍යවස්ථානුකූලව එම පුරප්පාඩු සම්පූර්ණ කරන බවත්, සඳහන් වේ.ඒ අනුව, වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව වසර 06 කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති විදුහල්පතිවරුන්හට ස්ථාන මාරු ලබාදීමට හැකියාව ඇති බව |
| | | වැඩිදුරටත් දන්වා සිටිමි.<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට පවතින වැටුප් විෂමතාවය විසඳන තෙක් එම සේවයේ නිලධාරීන්ට වැටුප් වර්ධක 12 ක් ලබා දීමට අංක: ED/SER/23/70 හා 2023.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක: අමප/23/1297/607/104 හා 2023.08.01 දිනැති ලිපියේ සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රට තුළ පවතින අහිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අවකාශය සීමා වී ඇති බැවින්,අංක03/2016(IV) හා 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හේතුවෙන් ඇති වී තිබෙන සියලුම වැටුප් විෂමතාවයන් සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සහ විධිමත් සමාලෝචනයක් සිදු කිරීමෙන් පසුව ඉදිරියේදී සමස්ථ රාජ්‍ය සේවයේම වැටුප් ව්‍යුහය සංශෝධනය කරනු ලබන අවස්ථාවකදී සංදේශයේ සඳහන් යෝජනාව සම්බන්ධයෙන් සලකා බැලීම යෝග්‍ය බව දැනුම් දී ඇත.<br>අනතුරුව සීමිත සහ සේවා පළපුරුද්ද හා කුසලතා පදනම යටතේ |

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බැඳුණු නිලධාරීන්ගේ වැටුප් විෂමතාව ඉවත් කර ගැනීම යන හිසින් යුතුව අංක: ED/SER/23/108 හා 2023.10.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ගුරු උපදේශක සේවයෙහි වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම යන හිසින් යුතුව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් යොමු කර ඇති අංක : අමප/23/1882/607/002 – II හා 2023.11.28 දිනැති ලිපියේ සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබ ඇති වැටුප් සංශෝධනය හේතුවෙන් පැන නැගී ඇති වැටුප් විෂමතා සහ ඒ සම්බන්ධයෙන් අනෙකුත් ගැටලු නිරාකරණය කිරීම පිණිස සුදුසු යෝජනා, සලකා බැලීම පිණිස සිය ඇමතිතුමා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් කරන ලද නිර්දේශය අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද බව දන්වා ඇත.

ඒ අනුව, වැටුප් විෂමතා ගැටලුව විසඳීම සම්බන්ධයෙන් 2024.03.21 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවති අතර එම වැටුප් විෂමතාව පැන නැගී ඇති ආකාරය පිළිබඳව විස්තරාත්මකව ඉදිරිපත් කරන ලද වාර්තා 2024.06.24 දිනැති සහ 2025.04.07 දිනැති ලිපි මගින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.

එම ලිපිවලට පිළිතුරු වශයෙන් 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (IV) නිකුත් කිරීම තුළින්, එම චක්‍රලේඛය අදාල වන සේවාවන්හි නිලධරයන් අතර මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනෙකුත් සේවාවන් අතර ද වැටුප් විෂමතා නිර්මාණය වී ඇති බවත්, මෙම ගැටලු විසඳීම 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 (IV) මගින් සිදු වී ඇති සියලුම වැටුප් විෂමතාවන්/ නොගැලපීම් සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයකින් පසුව සිදු කළ යුතු බවත්, එම ගැටලුව සම්බන්ධයෙන් ද මේ වන විටත් කටයුතු කරමින් පවතී, අංක EST/5/07/CBN/0001(i) හා 2025.08.03 දිනැති ලිපිය මගින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III ශ්‍රේණිය සඳහා සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පැවැති මුළු පුරප්පාඩු ගණන 67 ක් වන අතර ඉන් 2024.07.01 දින නිලධාරීන් 60ක් ද, 2025.03.03 දින නිලධාරීන් 4ක් ද, මේ වන විට බඳවා ගෙන ඇත. ඉතිරි පුරප්පාඩු 3 ඉදිරියේදී පිරවීමට නියමිතය. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III ශ්‍රේණියේ විවෘත පදනම මත පැවැති මුළු පුරප්පාඩු ගණන 113 ක් වන අතර 2025.07.01 දින පත්වීම් භාරගත් නිලධාරීන් ගණන 88 ක් වන බැවින් ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවා තවත් උපාධිධාරීන් 25 දෙනෙකු ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතය. තවද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III ශ්‍රේණියේ සීමිත පදනම මත පැවැති මුළු පුරප්පාඩු ගණන 442 ක් වන අතර ඉන් නිලධාරීන් 405 ක් සඳහා 2025.09.01 දින පත්වීම් ලබා දී ඇති අතර ඉතිරි පුරප්පාඩු 37 සඳහා ඉදිරියේදී බඳවා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් ඇත.

<u>ගුරු අධ්‍යාපනඥ සේවය</u>

ගුරු අධ්‍යාපනඥ සේවයේ සීමිත බඳවා ගැනීම්වල දී ගුරු සේවයේ සාපේක්ෂව වරින්වර සිදු වී ඇති වැටුප් පරිවර්තන හේතුවෙන් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට උසස්වීම් ලබන නිලධාරීන් අතර

| | | |
|---|---|---|
| | | වැටුප් විෂමතා පවතින අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු බව නිරීක්ෂණය කරමි.<br>2020.02.07 දිනට අයදුම්පත් කැඳවා ඇති නිලධාරීන් අතරින් සීමිත පදනම මත 2025.06.02 දිනැතිව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට නිලධාරීන් 591ක් බඳවා ගැනීම් සිදු කරන ලද අතර විවෘත පදනම මත 384 දෙනෙකු බඳවා ගැනීම සඳහා ලිඛිත විභාගය පවත්වා එහි ප්‍රතිඵල මත මූලික සම්මුඛ පරීක්ෂණ පවත්වා එහි නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කර ඇත. එම කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට නියමිත ය. එම කාර්යයන් අවසන් වූ පසු ඉදිරියේ දී නිලධාරින් බඳවා ගැනීමට නියමිත වේ. ඒ අනුව මේ වනවිට කාර්ය මණ්ඩල පුරප්පාඩු අවම වී ඇත.<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ ශ්‍රේණි උසස්වීම් ලබාදීම මේ වනවිට ප්‍රමාදයකින් තොරව ක්‍රමවත් පරිදි සිදු කරනු ලබයි. එම නිලධාරීන් අතරින් ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය නිලධාරීන් මේ වනවිටත් ස්ථානගත කර ඇති අතර, ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් පත් කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විමසීමට ලක්කර ඇත. පීඨාධිපති, උප පීඨාධිපති, ගුරු විද්‍යාල විදුහල්පති පත් කිරීමට අදාළව තනතුරු සඳහා පත්කිරීමේ සම්මුඛ පරීක්ෂණට අදාළ ගැසට් නිවේදනය පළ කිරීමට මේ වනවිට ප්‍රධාන කොමසාරිස් වෙතින් පුරප්පාඩු කැඳවා ඇත. |

ඇමුණුම 01

unesco
Sri Lankan
National Commission

5th Floor, Ministry of Education,
"Isurupaya", Battaramulla

Tel : 011-2177002
Ext : 1500
Fax : 011-2177007
Email : slncu@slt.lk
Web : www.slncu.lk

# Memo

වෙත : ප්‍රධාන මූල්‍ය නිලධාරී

විසින් : නියෝජ්‍ය මහලේකම්

දිනය : 2025/07/22

~~මගේ අංකය :U/04/FIN/58-(Sub)~~

විෂය : ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයේ සේවය කළ නිලධාරිණියකගේ තනතුර අහෝසි කිරීම වෙනුවෙන් වන්දි ගෙවීම.

---

ප්‍රංශයේ පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයේ යුනෙස්කෝ සම්බන්ධීකාර තනතුර ඇති කිරීම.

01. 2006-08-10 දිනැතිව අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක අමප/ 06/1486/229/087 සම්බන්ධයෙන් 2006 ඔක්තෝම්බර් මස 04 වන දින පැවැත් වූ අමාත්‍ය මන්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ශ්‍රී ලංකා යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාල සහයක තනතුර ඇති කිරීම සඳහා සංදේශයේ සඳහන් පරිදි පාරිශ්‍රමිකයක් ගෙවීම මත එම තනතුර පිරවීම මත ප්‍රංශයේ සිටින ශ්‍රී ලංකා තානාපතිට අවසර ලබා දීම සඳහා අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම 1-A, 1-B)

තවද, 2006/09/13 දිනැතිව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නිරීක්ෂණ පරිදි යථෝක්ත තනතුර ඇතිකිරීම අවශ්‍ය වන්නේ නම් එම ඉල්ලීම අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම සුදුසු බව යෝජනා කර ඇත. (ඇමුණුම 2)

එහෙත් මේ සම්බන්ධයෙන් ගන්නා ලද ඉදිරි කටයුතු වලට අදාල ලේඛණ යුනෙස්කෝ ශාඛාව සතුව නොමැති බව නිරීක්ෂණය විය.

02. තවද ශ්‍රී ලංකාවේ යුනෙස්කෝව සඳහා වන නිත්‍ය නියෝජිත කාර්යාලයේ කාර්ය සහයක තනතුරෙහි වැටුප් හා තනතුරු නාමය සංශෝධනය කිරීම යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2017-04-28 දිනැති අංක 17/0946/742/016 අමාත්‍ය මණ්ඩල යෝජනාව සලකා බලනු ලදුව, 2017-07-18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් එකී තනතුර සම්බන්ධීකරණ නිලධාරි වශයෙන් සංශෝධනය කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම 3- A, 3-B) තවද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගෙන එකී තනතුරට අදාළ වැටුප් පරිමාණය තීරණය කරන ලෙස ද උපදෙස් දී ඇත. ඒ අනුව 2017/10/27 දිනැති ලිපියෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් සියළු දීමනා ඇතුලත්ව (යූරෝ 2200)ක මාසික වැටුපක් ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත කාර්යාලයෙහි සම්බන්ධීකාරක තනතුර වෙනුවෙන් ගෙවීමට නිර්දේශ කර ඇත. (ඇමුණුම - 4)

එහෙත් කළමණාකරණසේවා දෙපාර්තමේන්තුවේ 2016/04/27 දිනැති ලිපිය මගින් ප්‍රංශයේ පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයෙහි සම්බන්ධීකාරක තනතුර අනුමත කළ නොහැකි බව දන්වා ඇත. (ඇමුණුම 5)

03.කෙසේවෙතත් ප්‍රංශයේ පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයේ යුනෙස්කෝ සම්බන්ධීකාර තනතුර සඳහා 2006 වර්ෂයේ දිලුම් ගුණවර්ධන මිය පත්කර ඇත. මෙම නිලධාරිණිය පත්කිරීම හා ඒවෙනුවෙන් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් 2020 පෙබරවාරි 07 වන දින ජාතික විගණන කාර්යාලය විසින් තොරතුරු විමසීමක් කර ඇත. 2021.12.31 වන දින සේවයෙන් පසු සම්බන්ධීකරණ නිලධාරිණියගේ සේවය අවසන් කිරීමට අධ්‍යාපන ලේකම් විසින් කටයුතු කර ඇති අතර, ඒ බව අංක U/04/FIN/58 හා 2022.01.25 දිනැති ලිපිය මගින් ප්‍රංශයේ පැරිස් නුවර සිටින තානාපතිතුමිය වෙත දන්වා යවා ඇත. නැවත වතාවක් 2020 - සැප්තැම්බර් මස 07 වන දින ජාතික විගණන කාර්යාලය විසින් තොරතුරු විමසීමක් කර ඇත. යළිත් 2022 - පෙබරවාරි මස 22 වන දින ජාතික විගණන කාර්යාලය විසින් තොරතුරු විමසීමක් කර ඇත.

මෙලෙස විමර්ශනය වෙමින් පවතින අතර ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙහි සම්බන්ධීකරණ තනතුරෙහි කටයුතු ඉටු කරමින් සිටි දිලුම් ගුණවර්ධන මිය විසින් ඇයගේ නීති සමාගම මගින් 2022- මැයි මස 05 වන දින ඇගේ තනතුර අත්හිටුවීම සම්බන්ධයෙන් හා ඇය හට වන්දි ලබා ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරන බව තානාපති වරිය මගින් අධ්‍යාපන ලේකම් වෙත දන්වා ඇත. මේ සඳහා නීත්‍යාණුකූලව කටයුතු කිරීමට අධ්‍යාපන ලේකම්ගේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ නීති නිලධාරිණිය වෙත අවශ්‍ය ලිපි ගොණු භාර දී ඇත. මේ තත්වය අතරතුර පැරීසියේ නිත්‍ය නියෝජිත කාර්යාලයේ නීති නිළධාරි විමසූ අතර 2022-09-15 දිනැතිව සහතික නොකරන ලද සටහනක් සමග එවා ඇත.

04. යුනෙස්කෝ සම්බන්ධීකරණ නිලධාරී දිලුම් ගුණවර්ධන මිය විසින් සිය තනතුර අත්හිටුවීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා ප්‍රංශ අධිකරණයෙහි පණවන ලද නඩුව හේතුකොට ගෙන අධ්‍යාපන අමාත්‍ය වරයා විසින් කැබිනට් මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරිමෙන් අනතුරුව අදාල වන්දි මුදල ප්‍රංශ තානාපති කාර්යාලය මගින් දිලුම් ගුණවර්ධන මිය වෙත ගෙවීම් කිරිම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කර ඇත.

05.ඒ අනුව 126-01-02-14-1508 යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභා වැය ශීර්ෂය මගින් වන්දි මුදල ගෙවීම සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇත.

මහාචාර්ය ප්‍රභාත් ජයසිංහ
මහ ලේකම්

**ඇමුණුම 2**

| අනු අංකය | විස්තරය | ගිණුම අනුව 2022.12.31 දිනටඅවුරුදු 1ට වැඩි ණය ශේෂ ප්‍රමාණය | 2022.12.31 ට පැවති අවුරුදු 1ට වැඩි ණය ශේෂයෙන් 2023.12.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් (3.2) | 52,314,025.22 | 8,326,234.65 |
| 2 | පළාත් සභා ආයතන සඳහා මාරු වී ගිය නිලධාරීන්ගෙන් (3.3) | 20,103,777.55 | 4,117,052.93 |
| 3 | මියගිය නිලධාරීන් (3.4) | 5,937,477.13 | 1,160,658.24 |
| 4 | විශ්‍රාම ගිය නිලධාරීන් (3.5) | 24,283,306.58 | 5,901,105.93 |
| 5 | වැඩ තහනම් කර ඇති නිලධාරීන් (3.6) | 3,554,421.29 | 54,344.38 |
| 6 | සේවය හැරගිය නිලධාරීන් (3.7) | 9,129,933.78 | 1,008,107.00 |
| 7 | වෙනත් නිලධාරීන් (3.8) | 5,871,297.52 | 5,000.00 |
| | මුළු එකතුව | 121,194,239.07 | 20,572,503.13 |

ඇමුණුම 01

ඇමුණුම 03

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

මගේ අංකය / எனது இல / My Ref } ED/3/37/01/122/COPA — ඔබේ අංකය / உமது இல / Your Ref } — දිනය / திகதி / Date } 2025.08.

ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මයා - අතිරේක ලේකම් (ආයතන)

සුජාතා කුලේන්ද්‍රකුමාර් මිය - අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)

දේවිකා ලියනගේ මිය - අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)

ඒ.එස්.ඩී. අලුත්ගේ මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරී ।

කේ.ඒ.ජේ. ප්‍රිෂංගිකා මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)

**"පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා ඉහළ නැංවීම" පිළිබඳ විමර්ශන කිරීමේ කමිටුව**

2025.07.23 දින පාර්ලිමේන්තුවේ පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා (COPA) කමිටු රැස්වීමේ දී ඉහත ව්‍යාපෘතියට අදාළව සැලසුම් සකස් කිරීම, පාසල් තෝරා ගැනීම, එම පාසල්වලට මුදල් වැය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් කර එහි වාර්තාවක් මාස 3ක් ඇතුළත රාජ්‍ය ගිණුම් කාරක සභා (COPA) කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

02. ඒ අනුව, ඉහත විමර්ශන කාර්යය සඳහා පිහිටුවන ලද පහත සඳහන් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ඔබ පත් කර ඇති බව කාරුණිකව දන්වමි.

1. සභාපති - ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මයා - අතිරේක ලේකම් (ආයතන)
2. සාමාජික - සුජාතා කුලේන්ද්‍රකුමාර් මිය - අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
3. සාමාජික - දේවිකා ලියනගේ මිය - අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)
4. සාමාජික - ඒ.එස්.ඩී. අලුත්ගේ මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරී ।
5. සාමාජික - කේ.ඒ.ජේ. ප්‍රිෂංගිකා මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)

03. මෙම විමර්ශනය සිදු කර 2025.10.03 දිනට පෙර වාර්තාවක් මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

04. තව ද, මෙම කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා ඔබ විසින් දක්වනු ලබන සහයෝගය හා සක්‍රිය දායකත්වය බෙහෙවින් අගය කරමි.

o/c

නාලක කළුවැව
ලේකම්

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister } ✆ +94112784832 ☎ +94112784825 ✉ minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } ✆ +94112784811 ☎ +94112785162 ✉ secretary.education@moe.gov.lk moesecretaryoffice@gmail.com

ඇමුණුම 02 (7)


අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකා.
"இசுருபாய", பத்தரமுல்ல, இலங்கை.
"Isurupaya", Battaramulla, Sri Lanka
+94112785141-50 | 94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref | ED/3/37/01/122/COPA | ඔබේ අංකය / உமது இல. / Your Ref | | දිනය / திகதி / Date | 2025.09.02 |

ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මයා - අතිරේක ලේකම් (ආයතන)

සුජාතා කුලේන්ද්‍රකුමාර් මිය - අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)

දේවිකා ලියනගේ මිය - අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)

ඒ.එස්.ඩී. අලුත්ගේ මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරී I

කේ.ඒ.ජේ. ප්‍රිෂංගිකා මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)

**"පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා ඉහළ නැංවීම" පිළිබඳ විමර්ශන කිරීමේ කමිටුව**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.08.27 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ උපදෙස් පරිදි උක්ත ලිපියේ සඳහන් ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා ඉහළ නැංවීමේ වැඩසටහන පිළිබඳ සිදු කරන විමර්ශනයට අමතරව එවකට පැවති අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද, විගණකාධිපතිවරයා විසින් කරුණු විමසා ඇති මෙහි ඇමුණුම් 01 හි සඳහන් ව්‍යාපෘති 72ක සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කර මාස තුනක් ඇතුළත රාජ්‍ය ගිණුම් කාරක සභාවට වාර්තා කරන ලෙස දන්වා ඇත.

03. මෙම විමර්ශනය කඩිනමින් සිදු කර මා වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි. තව ද, මෙම කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා ඔබ විසින් දක්වනු ලබන සහයෝගය හා සක්‍රිය දායකත්වය බෙහෙවින් අගය කරමි.

o/c

නාලක කළුවැව
ලේකම්

Ministry Of Education
Physical and Financial Progress of Development Pojects and Programmes as at 30th September 2025

| | Project | Location | Total Cost (Rs.Mn.) | | Project period From To (Month/ Year) | | Funding Source | Financial Targets and Progress (Rs.Mn.) | | | | | | | | Physical Targets and Progress | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | Allocation 2025 | Financial targets and progress- 2025 ( as at 30.09.2025) | | | | | | Cumulative expenditure (as at 30.09.2025) | Overall physical target ( expected outputs) of the project (A) | Cumulative physical progress as at 30th September 2025 as % of (A) | Physical targets and progress -2025 | | | | | | | | Cum |
| | | | | | | | | | | | | | | | | | | Targets | | | | | Progress (as at 30.09.2025) | | |
| | | | | | | | | | | | | | | | | | | | Cumulative quarterly targets (%) (B) | | | | | | |
| | | | Original | Current (if revised during implementation) | Original | Revised (if extended) | | | Expenditure target | Imprest Requested | Imprest Received | Actual Expenditure | Bills in hand | | | | | Descriptive target for 2025 | Q-1 | Q-2 | Q-3 | Q-4 | Description | as % of (B) | Description |
| Q3-2024 | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | Establishment of National College of Education and Teacher Training System for Technology Stream- (Construction only) | Kurunegala - Kuliyapitiya | 3,974.70 | 4,853.17 | 2017/01-2023/12 | 2022-2026 | GOSL/ KOICA | 2,496.00 | 2,176.02 | 907.65 | 857.19 | 813.03 | 44.16 | 3906.99 | 1. completion KOICA scope and completion of required utilities through MOE scope<br>2. completion male hostel and ocupying the student trainees | 75% | 1. completion of KOICA balance scope<br>2. completion of MOE scope<br>2. completion male hostel | 65% | 70% | 80% | 85% | **KOICA Scope**<br>The construction of Original KOICA scope has been completed. KOICA Balance scope (Stage II) work is ongoing<br>**MOE Scope**<br>01. Cafeteria Building has completed.<br>02. Fence work has completed<br>03. External service work is ongoing - (Road Carpet / Play Ground & landscaping) Progerss 99%<br>04. construction of male & female | 75% | 1. 98% completed<br>2. 9[illegible] completed<br>3. 8[illegible] completed |

pac@parliament.lk